# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2426/25 - 2025 මාර්තු මස 04 වැනි අඟහරුවාදා - 2025.03.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 04

පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත 2013 දෙසැම්බර් මස 11 දින අංක 1840/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සඳහා 2024 මැයි මස 06 වැනි දින අංක 2383/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සංශෝධන අංක 04 වෙනුවට මෙහි දැක්වෙන සංශෝධනය ආදේශ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇත.

සංශෝධන අංක 01 - 2017 අගෝස්තු මස 16 වැනි දින හා අංක 2032/26 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2018 ජනවාරි මස 04 වැනි දින හා අංක 2052/26 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2019 සැප්තැම්බර් මස 09 වැනි දින අංක 2140/4 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04 - *2024 මැයි මස 06 වැනි දින අංක 2383/06 *අති විශෙෂ ගැසට් පත්‍රය*

* මේ වෙනුවට පහත සංශෝධනය ආදේශ කෙරේ.

1.7 ඡේදයේ පහත පරිදි සංශෝධනය විය යුතුය.

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම හෝ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඊට සමාන ලෙස පිළිගනු ලබන විභාගයක් සමාන විෂය සාධනයක් සහිතව එක්වරකදී සමත්වීම.

(අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු කළමනාකරණ සේවා නිලධාරී සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යයයි)

සහ


1A - G 43898 — 05 (2025/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සියළුම විෂයයන්ගෙන් එක්වරක් සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත් ය.) හෝ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඊට සමාන ලෙස පිළිගනු ලබන විභාගයක් සමාන විෂය සාධනයක් සහිතව එක්වරකදී සමත්වීම.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

EOG 03 - 0029

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.